


## දොස්තරගේ දැනුම

දැඩි අසනීපයෙන් රෝහල්ගත වූ සිරිපාල මිය ගියේය. ඔහුගේ දේහය ට්‍රොලියක තබාගෙන රෝහලේ කම්කරුවෙක් යන අතරතුර එකවිටම සිරිපාල ට්‍රොලියෙන් නැගිට්ටේය.

**සිරිපාල** ඕයි තමුසෙ කොහෙද මාව ගෙනියන්නෙ?
**කම්කරුවා** තමුසේ මෝචරියට ගෙනියන්නේ
**සිරිපාල** මෝචරියට ගෙනියන්න මම මැරිල ද ඕයි
**කම්කරුවා** මැරිච්ච හින්ද නේන්නම් ඕයි ගෙනියන්නෙ
**සිරිපාල** මං මැරිල නෑ ඕයි, මේ කතා කරන්නේ තමුසෙට පේන්නැද්ද?
**කම්කරුවා** කරදර නොදී හාන්සි වෙනවා ඕයි, තමුසෙ දන්නවද දොස්තර මහත්තයට වැඩිය

---

## නොකෙරෙන පත්වීම

පක්ෂයේ ලේකම් හා රූපවාහිනී නිවේදකයකු අතර පැවැති සාකච්ඡාවකි මේ.

**නිවේදක** දැන් තමුන්නාන්සේලාගේ පක්ෂයෙන් ජනාධිපති අපේක්ෂක හැටියට ඉදිරිපත් කරන කෙනා කව්ද ?
**ලේකම්** ඒක අපි පක්ෂයේ ඊළඟ සභා වාරයේදී සාකච්ඡා කරලා තීරණය කරනවා, එතකොට කියන්නම්.
**නිවේදක** එතකොට ඔබතුමාලගේ ඊලග සභාවාරය පවත්වන්නෙ කවද්ද?
**ලේකම්** ඒක අපේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ දී සාකච්ඡා කරලා තීරණය කරනවා.
**නිවේදක** එතකොට කෘත්‍යාධිකාරී මණ්ඩල රැස්වීම හෙට අනිද්දා තියයි කියලා මම හිතන්නේ.
**ලේකම්** කෘත්‍යාධිකාරී මණ්ඩලය රැස් වෙන දිනය අපි කැබිනට් රැස්වීමේදී සාකච්ඡා කරලා තීරණය කරනවා.
**නිවේදක** එතකොට කැබිනට් රැස්වීම තියෙන කවද්ද කියලා ඔබතුමාට කියන්න පුළු වන්ද?
**ලේකම්** ඒකට තවම දිනයක් නෑ

---

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au







